කුරුණෑගල මහා නගර සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ නාගරික කොමසාරිස් වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). සමාලෝචිත වර්ෂය සඳහා මුළු පුනරාවර්තන ආදායම් බිල් කිරීම් රු.536,132,075 ක් වූ අතර, ඉන් රු.64,181,059 ක් වූ වරිපනම් ගිණුම්ගත කිරීම සඳහා ලෙජර් ගිණුමක් පවත්වා තිබුණද, එකතුව රු.471,951,016 ක් වූ අනෙකුත් සියළුම ආදායම් ගිණුම්ගත කිරීම සඳහා එක් ලෙජර් ගිණුමක් පවත්වා තිබුණි.

(ආ) රු.3,768,898 ක් වූ ටෙන්ඩර් ඇප තැන්පත් මූල්‍ය ප්‍රකාශනවල රු.5,560,941 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) අදාළ ලේඛන අනුව නව සාප්පු සංකීර්ණයේ කඩ කුලී හිඟය රු.538,000 ක්, හිඟ සේවා ගාස්තු රු.311,286 ක් සහ හිඟ දඩ මුදල් රු.1,547,968 ක් පිළිවෙලින් රු.533,500 ක්, රු.308,786 ක් සහ රු.1,547,518 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කලින් ලද ආදායම් රු.263,484 ක් වූ අතර එය මූල්‍ය ප්‍රකාශනවල රු.1,568 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) ආරම්භක ශේෂය ඉක්ම වූ රු.9,576,968 ක ණයහිමි ශේෂයන් නිශ්චිතව හඳුනා නොගෙන කපාහැර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා අදාළ රු.10,589,608 ක එකතු කළ අගය මත බදු, වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) වත්කම් මිලදී ගැනීමට අදාළ රු.388,373 ක් වූ එකතු කළ අගය මත බදු මුදල් වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඌ) රු.678,227 ක පාරිභෝජ්‍ය භාණ්ඩ ලිබඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(එ) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරි කාලයේදී මිලදී ගැනීමට අපේක්ෂිත රු.7,766,494 ක් වූ වත්කම් කාණ්ඩ 04 කට අදාළ වටිනාකම් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.51,546,495 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මස තොග ජල මිලදී ගැනීමේ වටිනාකම වූ රු.4,112,041 ක් ප්‍රවාහන, සම්බන්ධතා වෙනත් සේවා යටතේ දැක්විය යුතු වුවද, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු කිරීම යටතේ ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්**

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 08 ක ශේෂයන් හා ඒවාට අදාල උප ලේඛනවල ශේෂයන් අතර රු.27,046,101 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) ජර්නල් අංක 19 මගින් වියදම් ණයහිමි අතිරික්ත වෙන් කිරීම් වශයෙන් රු.40,865,753 ක ණයහිමි ශේෂ කපාහැර තිබුණද, ඊට අදාළ උපලේඛන අනුව අදාළ ශේෂයේ වටිනාකම රු.41,306,752 ක් වූයෙන් රු.440,999 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අගරු චෙක්පත් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.741,006 ක් වූ නමුත් උපලේඛනය අනුව රු.728,003 ක් වූයෙන් වෙනස රු.13,003 ක් විය.

### 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

i. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.134,061,608 ක් වූ ලැබියයුතු ගිණුම්වලින් රු.31,532,844 ක් වසරකට වැඩි කාලයකට අදාළ විය. තවද රු. 91,432,824 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක්ද පිළියෙල කර නොතිබුණි.

ii. 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වර්ෂයන් තුළ අගරු වූ චෙක්පත් 15 කට අදාළ රු.728,003 ක ශේෂයක් විය.

(ආ) ගෙවියයුතු ගිණුම්

--------------------

i. 2016 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂය රු.85,243,946 ක් විය.

ii. සමාලෝචිත වර්ෂය අවසානයට 1956 සිට 2016 දක්වා කාල පරාසය තුළ තැන්පත් කර ඇති රු.73,579,691 ක් වූ තැන්පත්වලින් නිරවුල් කළ හැකි ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට සහ නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ණය ශේෂය රු.81,587,381 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

ගිණුම් විෂයයන් 13 කට අදාළ එකතුව රු.328,786,949 කට අදාළව විස්තරාත්මක උපලේඛන, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා, 1956 සිට 1997 වසර දක්වා වූ ජල සේවා තැන්පත් ලේඛනය, තැන්පත් ලේඛන, මුද්දර ගාස්තු ලේඛනය හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම විෂයයන් පිළිබඳ විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

**1.3.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**-------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | |
| i. මු.රෙ. 396 (ඈ) | නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්මවූ රු.81,520 ක චෙක්පත් 24 ක් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| ii. මු.රෙ. 571 | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවූ රු.20,334,859 ක් වූ තැන්පත් 1046 ක් පැවතුණි. |
| iii. මු.රෙ. 751 (2) | නගර සභාව සතු නිල නිවාසවල නගර ශාලාව හා ගොඩනැගිලිවල සවිකර ඇති විදුලි හා උපකරණ සම්බන්ධයෙන් බඩු ලේඛන පවත්වාගෙන නොතිබුණි. |
| iv. මු.රෙ. 751 (4) | ලැබුණු භාණ්ඩ ලේඛන ගතකර නොතිබුණු අතර බින්කාඩ් පත් පමණක් පවත්වාගෙන තිබුණි. භාණ්ඩ ක්‍රමවත්ව පිළිවෙලකට අසුරා නොතිබුණු අතර මේ හේතුවෙන් භෞතික පරීක්ෂාවේදී තොග ශේෂ තහවුරු කර ගැනීමට අපහසු විය. |
| v. මු.රෙ. 755 (1) (2) | ගබඩා නිලධාරීන් විශ්‍රාම යාම, මාරු වීම් අවස්ථාවලදී ගබඩාවේ පැවති භාණ්ඩ විධිමත්ව භෞතික තොග ශේෂ පරීක්ෂා කර බලා භාරදී නොතිබුණු බැවින් තොගවල ඌණතා හා අතිරික්තතා පැවතුණි. |

| | | |
|---|---|---|
| vi. | මු.රෙ. 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ භෞතිකව පරීක්ෂාවකින් තොරව සිදුකර තිබුණු අතර, තොගපොත් නිසි පරිදි තුළනය කිරීම සිදුකර නොතිබුණි. |
| vii. | මු.රෙ. 762 | දිගු කාලයක් තිස්සේ භාවිතයට නිකුත් නොකරන අනවශ්‍ය තොග රැස්කර ගෙන තිබුණි. |
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (වයඹ) විසින් ආඳාගල කන්ද වත්ත ඉඩම කට්ටි කිරීමට නිර්දේශ කළ 2014 ඔක්තෝබර් 10 දිනැති ලිපිය | ඉඩම් කට්ටියක අවම බිම් ප්‍රමාණය පර්චස් 15 ට නොඅඩු විය යුතු වුවද ආඳාගල කන්ද වත්ත, මුත්තෙට්ටුගල ඉඩමේ ලොට් අංක 17 හා 33 හි බිම් ප්‍රමාණය ඊට අඩු විය. |
| (ඇ) | <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u> | |
| | 2014 ජූනි 16 දිනැති අංක 16/2014 දරන චක්‍රලේඛය | නිල වාහනයක් භාවිතා කිරීමට හිමිකම් නොමැති නිලධාරියකු නිල වාහනයක් භාවිතා කර 2016 අගෝස්තු සිට නොවැම්බර් දක්වා ඉන්ධන ලීටර් 322 වෙනුවෙන් රු.30,637 වැයකර තිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.136,766,383 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.198,984,605 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.62,218,222 ක පහත වැටීමක් සිදුවී තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-------------------------------------

වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු, වෙනත් ආදායම් සහ ආදායම් ආධාර පිළිවෙලින් රු.9,090,917 ක්, රු.1,562,076 ක්, රු.51,048,214 ක් සහ රු.21,652,971 කින් අඩුවීම හා මූල්‍ය ප්‍රතිඵලයේ පහතවැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

-----------------------

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය**

-----------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 655 ක් වුවද රු.මිලියන 536 ක් පමණක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 121 ක් වූ හිඟය සමාලෝචිත වර්ෂය අවසන් වන විට මිලියන 125 දක්වා වැඩි වී තිබුණි.

**2.3.2 වරිපනම්**

-----------

සමාලෝචිත වර්ෂයේ වරිපනම් කොට්ඨාස 12 ක වරිපනම් ඒකක 14280 කට අදාළව බිල්කළ ආදායම රු.62,632,717 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආදායම රු.37,850,288 ක් විය. එය වාර්ෂික බිල් කිරීමෙන් සියයට 60 ක් වූ අතර ඒ තුළ රජයේ දේපළ 13 කට අදාළව අයවිය යුතු රු.3,141,540 ක ශේෂයක් විය.

**2.3.3 කඩ කුලී**

--------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට කුරුණෑගල නව සාප්පු සංකීර්ණයෙහි කඩ කාමර 54 කට අදාළව රු.538,000 ක කඩ කුලී හා රු.311,286 ක සේවා ගාස්තු හිඟයක් පැවතුණි.

(ආ) කුරුණෑගල බස් නැවතුම්පල කඩ කාමර 71 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු කඩ කුලිය රු.879,314 ක් වූ අතර, හිඟව පැවති පෙර ගෙවුම් මුදල රු.890,605 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රජපිහිල්ල හා රන්තලිය යන තානායම් දෙකෙන් අයවිය යුතු රු.6,254,150 ක තානායම් කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,421,646 ක් වූ පොදු වෙළඳපල හා අනෙකුත් කඩ කුලී ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.3.4 ජල ආදායම්**

--------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ආදායම් රු.41,789,884 ක් විය. රු.50,000 ට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයන් 87 කට අදාළව රු.18,576,354 ක හිඟයක් පැවති අතර එය මුළු හිඟයෙන් සියයට 44 ක් විය. ඉන් නාගරික කොමසාරිස් ලෙස බිල්කළ රු.3,422,421 ක හිඟයක්ද, පාරිභෝගික අංක 6747 යටතේ විල්ගොඩ පාර පොදු ජල කරාමයට අදාළ රු.2,294,742 ක හිඟයක්ද, පාරිභෝගික අංක 5163 යටතේ කුරුණෑගල ශික්ෂණ රෝහලට අදාළව රු.4,705,999 ක හිඟයක්ද පැවතුණි.

**2.3.5 වෙනත් ආදායම්**

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.740,821 ක වැසිකිලි ටෙන්ඩර් මුදලක් අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ලොතරැයි කුටි කුලී හා සංචාරක කුලී ආදායම් එකතුව රු.2,783,951 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,415,457 ක උසාවි දඩ මුදල් හා රු.27,800,577 ක මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වන ටයර් හා ටියුබ්, විදුලි උපකරණ, ලිපි ද්‍රව්‍ය, ජලනල හා උපාංග, යකඩ පට්ටම්, කම්බි, GI බට ආදී උපාංග සඳහා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලේඛන නඩත්තු කර නොතිබුණි.

(ආ) සභාවේ වාහන 15 ක් අපහරණ තත්ත්වයේ පැවතියද, සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මහා නගර සභා (252 අධිකාරය) 247 (ඉ) ප්‍රකාරව මහ නගර සභා පාලන සීමාව තුළ ඉඩම් විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට 01 ක් සභාවට ගෙවියයුතු වුවද, ආඳාගල කන්ද වත්ත, මුත්තෙට්ටුගල ඉඩම කට්ටි කිරීමේදී ඉඩම් කට්ටි 42 කට අදාළව ඔප්පු වටිනාකම් අනුව රු.236,537 ක් බදු මුදල් අඩුවෙන් ලබාගෙන තිබුණි.

(ඈ) සභාවේ බැංකු ගිණුම් 03 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව අවස්ථා 05 ක් යටතේ රු.42,953 ක හඳුනා නොගත් ලැබීම්, අවස්ථා 04 ක් යටතේ රු.40,538 ක වර්ෂයකට වැඩි කාලයක සිට පවතින මුදල් නොවූ ලැබීම් හා අවස්ථා 02 ක් යටතේ රු.1,653 ක හඳුනා නොගත් ගෙවීම් ශේෂයක්ද පැවතුණි.

(ඉ) දැව කඳන් තොගයක්, ඉරූ දැව තොගයක්, PVC උපාංග හා ජලනල තොගයක්, ටයර්, බාහිර පුද්ගලයෙකු සතු භාණ්ඩ හා ගලවා ඉවත් කළ භාණ්ඩ මිනුම් ගැනීමෙන් හා තොග පොත්වලට ගැනීමෙන් තොරව ගබඩාවේ හා එළිමහන් භූමියේ ගොඩගසා තිබුණි.

(ඊ) ගොඩනැගිලිවලින් ගලවා ඉවත් කරන ලද විශාල භාණ්ඩ ප්‍රමාණයක් ස්වාභාවික ආපදාවන්ට නිරාවරණය වන අයුරින් නගර සභා කාර්යාල පරිශ්‍රයේ තැනින් තැන අවිධිමත්ව, ගණනය කළ නොහැකි අයුරින් අනාරක්ෂිතව ගොඩගසා තිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉඩම් ලේඛනය අනුව එකතුව අක්කර 35 රූඩ් 1 පර්චස් 39.13 ක් වූ ඉඩම් 30 ක ඔප්පු සභාව සතුව නොතිබුණි.

(ආ) ඉඩම් ලේඛනයේ සඳහන්ව ඇති ඉඩම් නියැදියක් තෝරාගෙන 2016 සැප්තැම්බර් 05 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී අක්කර 34 රූඩ් 01 පර්චස් 42.03 ක් වූ ඉඩම් 04 ක් පෙන්වාදීමට සභා නිලධාරීන් අපොහොසත් විය.

(ඇ) පර්චස් 16.48 ක වර්ග ප්‍රමාණයකින් යුක්ත විල්ගොඩ බිම් බෝගස පිහිටි ඉඩමෙන් පර්චස් 13 ක පමණ කොටසක් අනවසර ඉදි කිරීම් සිදුකර බාහිර පාර්ශවයන් විසින් භාවිතයට ගෙන තිබුණි.

(ඈ) විල්ගොඩ මෝලවත්ත ළිඳ සමඟ ඉඩමෙහි වර්ග ප්‍රමාණය අක්කර 19 රූඩ් 2 පර්චස් 24 ක් ලෙස දක්වා තිබුණත්, භෞතිකව පෙන්වන ලද ඉඩම අක්කර 1 ටත් වඩා අඩු වර්ග ප්‍රමාණයකින් යුක්ත විය.

(ඉ) ආදාගලවත්ත මිලේනියම් සිටි ඉඩම ඉඩම් කට්ටි කිරීමේදී සභාවට ලබාදුන් අක්කර 01 රූඩ් 03 පර්චස් 01 බිම් කොටසින් භාගයක් පමණ කුඩා වැවකින් යුක්ත වීම හේතුවෙන් සභාවට අවාසිදායක තත්ත්වයක් ඇති වී තිබුණි.

(ඊ) ආදාගල කන්ද වත්ත ඉඩම කට්ටි කිරීමේදී පොදු කටයුතු සඳහා ගල් සහිත ඉඩමක් සභාව වෙනුවෙන් වෙන්කර තිබුණි.

**3.3 නිශ්ක්‍රීය වත්කම්**

-----------------

පර්චස් 30 ක වර්ග ප්‍රමාණයකින් යුක්ත විල්ගොඩ මිල්ස් ඉඩම 2012 වර්ෂයේදී රු.6,000,000 කට සභාව විසින් මිලදීගෙන තිබුණු අතර 2016 වර්ෂය වන විටත් කිසිදු කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පෙර පාසැල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදි කිරීම

----------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

i. සභා අරමුදල් රු.25,418,023 ක් වැයකර 2014, 2015 සහ 2016 වර්ෂවලදී අදියර 05 ක් යටතේ මෙම ගොඩනැගිල්ලේ කොටසක් 2016 සැප්තැම්බර් වන විට ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ල මහල් 04 ක් ලෙස ඉදි කිරීමට සැලසුම් කර තිබුණද, ඉදි කිරීමේ කටයුතු අදියර ලෙස කඩා පළමු අදියර වටිනාකම සීමිත මිල ගණන් කැඳවිය හැකි රු.1,790,637 කට සීමා කර තිබුණි. ඉන් අනතුරුව විවෘත මිල ගණන් කැඳවා තිබුණද, එක් කොන්ත්‍රාත්කරුවෙක් ආරම්භ කර අර්ධ නිමි ඉදි කිරීමක් සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු ඉදිරිපත් නොවූ බැවින් මුල් කොන්ත්‍රාත්කරු විසින් අදාළ ඉදි කිරීම සිදුකර තිබුණි.

ii. ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 5.4.8 (ආ) වගන්තිය ප්‍රකාරව කාර්යය සාධන බැඳුම්කරය අපේක්ෂිත සම්පූර්ණ කිරීම් දිනෙන් ඔබ්බට දින 28 ක් විය යුතු වුවද, අදියර I, II, III, IV ඊට අනුකූලව නොතිබුණි. තවද කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අදාළව කාර්යය සාධන බැදුම්කරයේ කාලය දීර්ඝ කර නොතිබුණු අතර අදියර III ඉදි කිරීම් දින 30 ක් ප්‍රමාද වීමට අයකළ යුතු රු.53,460 ක ප්‍රමාද ගාස්තුද අයකර නොතිබුණි.

iii. ගිවිසුම් පරිදි අදාළ ප්‍රමාණ පත්‍රයන්ට අනුකූලව නාන කාමර හා වැසිකිළි පද්ධති සඳහා සඳහන් කර තිබුණු නිෂ්පාදිත මාදිලිය ඇමරිකන් ප්‍රමිතිය සහිත උපාංග (American Stauderd) වුවද, 2016 අගෝස්තු 25 දින තාක්ෂණික නිලධාරීන් සමග සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී රු.387,000 ක උපාංග 25 ක් චීනය, මැලේසියාව, ශ්‍රී ලංකාව යන රටවල නිෂ්පාදන වලින් යොදා තිබුණි.

iv. මිල කැඳවීම් කොන්දේසි අනුව හා අනුමත රේටයන් භාවිතා කරන විට ඉදි කිරීම් කටයුතු සඳහා ජලය සහ විදුලිය කොන්ත්‍රාත්කරු විසින් සපයාගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණ පත්‍රයට සම්බන්ධතා ගාස්තුවක් පමණක් ඇතුළත් කළ හැකි වුවද, ඉහත කර්මාන්තයේ මුල් අදියර හතර සඳහා රු.22,751,900 ක් වූ නිම්වැඩ වටිනාකම සම්පූර්ණ කිරීම සඳහා ජලය සහ විදුලිය නගර සභාව විසින් සපයා තිබුණු අතර රු.13,994,838 ක කෙරෙමින් පවතින පස්වන අදියර සඳහා ද ජලය සහ විදුලිය නගර සභාව විසින්ම සපයමින් පැවතුණි. මේ සඳහා සුදුසු අඩු කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) රු.1,943,556 ක ඇස්තමේන්තුගත වටිනාකම මත 2015 සභා අරමුදල් වැයකර ආදාගල ප්‍රජා ශාලාව දෙවන අදියර කර්මාන්තය සිදුකර තිබුණි. 2015 ජූලි 28 දින දක්වා සීමිත මිල ගණන් කැඳවූ බව සඳහන්ව තිබුණද, ඊට අදාළ තොරතුරු ඉදිරිපත් නොකරන ලදී. වැඩ අවසන් කිරීමට අපේක්ෂිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා කාර්යය සාධන බැදුම්කරය ලබාගත යුතු වුවද, එය වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනට ලබාගෙන තිබුණි. ගිවිසුම් පරිදි කොමඩ් වැසිකිලි පෝච්චිය සහ සෙරමික් මුහුණ සෝදන බේසම ටොටෝ හෝ ඇමරිකන් සම්මත ප්‍රමිතියෙන් යුතු උපාංග සවිකළ යුතු වුවද, මැක්ස් ග්ලෝබල් උපාංග සවිකර තිබූ බව 2016 අගෝස්තු 25 දින තාක්ෂණ නිලධාරී සමග සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) නව කාර්යාල සංකීර්ණය හා විවේකාගාරය ඉදි කිරීම
---------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

i. කර්මාන්තයේ ගිවිසුම් කාලය මාස 06 ක් වුවද, කොන්ත්‍රාත්කරු මාස 03 කට ඉදිරිපත් කර තිබූ බැදුම්කරය පිළිගෙන තිබූ අතර, අදියර 01 ඉදි කිරීම් දින 23 ක් ප්‍රමාද වී තිබුණද, ප්‍රමාද ගාස්තු අයකර නොතිබීම සහ කාර්ය සාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කිරීමද සිදුකර නොතිබුණි.

ii. ලංසු ආරාධනා පත්‍ර හා අනුමත රේටයන් භාවිතා කිරීම් සඳහා වූ මග පෙන්වීම් අනුව සියළුම ජලය හා විදුලියද ඇතුළුව පාරිභෝජ්‍ය වියදම් කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු අතර, ඒ සඳහා එකතු අගයක් පමණක් ගෙවියයුතු බව නිශ්චිතව දක්වා තිබුණද, පළමු අදියර ජල සම්බන්ධතාව සඳහා රු.35,000 ක්ද විදුලි සම්බන්ධතාවය සඳහා රු.40,000 ක එකතු අගයක් ගෙවා තිබියදී, පළමු අදියර යටතේ රු.10,124,132 ක

නිම්වැඩ සම්පූර්ණ කිරීමට ජලය සහ විදුලිය සභාව විසින් සපයා තිබුණි. ඊට අමතරව දෙවන අදියර සඳහා ගෙවනු ලැබූ සහතික වැඩ වටිනාකම වූ රු.7,973,173 ක් (වැට් සහිත) ඉදි කිරීම් කටයුතු සඳහා ද තුන්වන අදියරින් 2016 අගොස්තු 25 දින වන විට සහතික කළ වැඩ වටිනාකම වූ රු.7,620,358 ක් සඳහා ද ජලය සහ විදුලිය සභාව විසින් සපයා තිබුණි.

iii. ප්‍රමාණය පත්‍රය අනුව ව්‍යාපෘති කළමනාකරණය ලෙස රු.400,000 දක්වා ගෙවීම් කර තිබුණු අතර එවැනි ගෙවීමක් ඇතුළත් කිරීමේ සාධාරණ පදනමක් විගණනයට පැහැදිලි නොවීය. තවද කොන්ත්‍රාත්කරු එවැනි කටයුතු ඉටුකර නොතිබුණු අතර මහා නගර සභාවේ ඉංජිනේරු අංශය මගින් එම කටයුතු ඉටුකර තිබුණි.

iv. මෙම ඉදිකිරීමේ දෙවන අදියර මගින් බිම් මහලේ වැසිකිලි පද්ධතිය සඳහා රු.313,700 ක් වූ උපාංග 19 ක් ප්‍රමාණ පත්‍රයේ සඳහන් පරිදි ටොටෝ, ඇමරිකන් ප්‍රමිතියෙන් යුතු උපාංග සවි කළයුතු වුවද චීනය, මැලේසියාව සහ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදිත උපාංග සවිකර තිබූ බව 2016 අගෝස්තු 25 දින තාක්ෂණික නිලධාරී සමඟ කල ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

v. මහල් 04 කින් යුතුව නිම කිරීමට සැලසුම් කරන ලද නව කාර්යාල සංකීර්ණය සහ විවේකාගාරය 2016 අගෝස්තු 25 දින වන විට සැලසුම් කර තිබුණු අදියර 02 ක කටයුතු නිමකර 03 වන අදියර ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙම කර්මාන්තයේ ඉදි කිරීම් ඇස්තමේන්තුව බාහිර ආයතනයක් මගින් සිදු කල බව සඳහන් කර තිබුණද, භාවිතා කරනු ලැබූ මිල ගණන් කුමන ආයතනයකින් අනුමත වූ රේටයන්ගෙන් ලබා ගත්තේද යන්න පැහැදිලි කර නොතිබුණි.

(ඉ) නගර ශාලාවේ වහලය අළුත්වැඩියා කිරීම
---------------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

i. ඉහත කර්මාන්තයේ රු.3,800,000 ක් වූ ඇස්තමේන්තු වටිනාකම ජාතික තරඟකාරීත්වය මගහැර සීමිත මිල ගණන් කැඳවිය හැකි පරිදි රු.2,000,000 හා රු.1,800,000 ක් ලෙස අදියර 02 කට වෙන්කර තිබුණි.

ii. ඇස්තමේන්තු අනුමත කිරීම, මිල ගණන් කැඳවීම, සැපයුම්කරුවන් තොරා ගැනීම සිදු කිරීමට පෙර මුදල් හා නීතිය පිළිබඳ කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවද, එම කටයුතු සම්පූර්ණ කර පසුව අනුමැතීන් සඳහා ඉදිරිපත් කර තිබුණි.

(ඊ) නගර ශාලා සිවිලිම අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය සඳහා රු.2,620,000 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව 2015 අප්‍රේල් 08 දින රු.1,850,000 ක් සහ 2016 මාර්තු 18 දින රු.770,000 ක් ලෙස වෙන් කර ජාතික තරඟාකාරී මිල ගණන් කැඳවීමෙන් මගහැර සීමිත මිල ගණන් කැඳවා ලබාදී තිබූ අතර, පළමු කොන්ත්‍රාත්කරුටම දෙවන අදියරද ලබාදීමට කටයුතු කර තිබුණි. තවද අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය විදුලිය කොන්ත්‍රාත්කරු විසින් සපයාගත යුතු වුවද, මහ නගර සභාව විසින් විදුලිය සපයා තිබූ අතර, ඊට අදාළව අයකර ගැනීම් සිදුකර නොතිබුණි. සිවිලිමේ වැඩ අවසන් කර කෙටි කාලයකින් සිවිලිමේ කොටස් ගැලවී බිම ඇද වැටීම් 2017 ජූලි 31 වන විටද යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක පවත්වාගෙන ගොස් තිබූ අතර, 2017 ජූලි 11 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැසිකිලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඉදි කරන ලද පද්ධතිය තුළින් මුදා හරින ලද ජලය නියමිත පරිදි පෙරී නොතිබීම නිසා ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයක් පැන නැගීම හේතුවෙන් වර්තමානයේදී වැසිකිලි අපද්‍රව්‍ය මෙම ස්ථානයට බැහැර කිරීම නවතා දමා තිබුණි.

(ආ) කොම්පෝස්ට් පොහොර නිපදවීම සඳහා භාවිතා කරන, කසළ වෙන්කරනු ලබන යන්ත්‍රයක් වසරක පමණ කාලයක් තුළ අක්‍රිය තත්ත්වයට පත්ව තිබුණි.

(ඇ) සතියේ දිනයක් තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට කසළ ලෝඩ් 25 ත් 30 ත් අතර ප්‍රමාණයක් රැස් කරන අතර එම ප්‍රමාණයෙන් සියයට 25 ක් පමණ වෙන් කරන ලද කසළ ලෙස රැස්කර තිබුණි. එකතු කරන ලද මුළු කසළ ප්‍රමාණයෙන් සියයට 75 ක් පමණ වූ කසළ ලෝඩ් 20 කට වැඩි ප්‍රමාණයක් විවෘත භූමිය තුළ වර්ගීකරණය කිරීමකින් තොරව බැහැර කිරීම නිසා භූමිය තුළ කසළ කන්දක් නිර්මාණය වී තිබුණි.

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වාහන 21 ක් වෙන්කර තිබූ අතර විගණිත දින වන විට එයින් වාහන 10 ක් අක්‍රියව තිබීම හේතුවෙන් භාවිත තත්ත්වයේ නොතිබුණි.

# 04 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

-------------------------------------

## 4.1 අයවැය පාලනය

---------------------

සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 05 ක හා වියදම් විෂයයන් 07 ක අයවැයගත හා සත්‍ය සංඛ්‍යා අතර සියයට 15 සිට 51 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයක් පැවතුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

---------------------

අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්තව එක් අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පමණක් පත්කර තිබුණු බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

--------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දුර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මගින් මහා නගර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ආදායම් හා වියදම් සඳහා ප්‍රමාණවත් කේවල ලෙජර් ගිණුම් පවත්වාගෙන නොගැනීම<br>ii. පාලන ගිණුම් නොසැසඳීම්.<br>iii. ස්ථාවර වත්කම් විස්තරාත්මක උපලේඛන මගින් තහවුරු නොකිරීම.<br>iv. ගෙවිය යුතු ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව කටයුතු කිරීම.<br>ii. ඉදි කිරීම් සඳහා අවශ්‍ය ජල හා විදුලිය ගාස්තු අය කිරීමකින් තොරව ලබාදීම. |
| (ඇ) | වාහන පාලනය | i. ක්‍රියාවිරහිත වූ වාහන අළුත්වැඩියා නොකර නිෂ්කාර්යව පැවතීම.<br>ii. අසම්පූර්ණව හා ප්‍රමාදව ධාවන සටහන් සම්පූර්ණ කර විෂයභාර නිලධාරිට භාරදීම.<br>iii. අපහරණය කළයුතු වාහන දීර්ඝ කාලයක් ඒ ආකාරයෙන් පැවතීම. |
| (ඈ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | කසළ වර්ගීකරණය නොකර එකතු කිරීම සහ බැහැර කිරීමට නිසා ක්‍රමවේදයක් නොතිබීම. |
| (ඉ) | ආදායම් | දීර්ඝ කාලීනව අය නොවී පැවත එන කාල විශ්ලේෂණ ඉදිරිපත් කළ නොහැකි හිඟ ආදායම් පැවතීම. |